# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/14 - 2011 ජුනි 22 වැනි බදාදා - 2011.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

**මුදල් නීති පනත**

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
සභාපති,
මුදල් මණ්ඩලය.

2011 ජුනි මස 20 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි

**2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය**

1.1 මෙම රෙගුලාසි, “2011 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි” යනුවෙන් හැඳින්විය යුතුය. — 1. හැඳින්වීම

2.1 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ. — 2. මූලික රෙගුලාසි සංශෝධනය

2.2 7 වැනි රෙගුලාසිය, එහි 7.3 ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ. — 7.3 දරන රෙගුලාසි සඳහා ආදේශනය

> "7.3 අරමුදලට කෙරෙන හර කිරීම් යටතට තැන්පතුකරුවන් වෙත ගෙවනු ලබන වන්දි මුදල්, ආයෝජන සහ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි අරමුදල පවත්වාගෙන යාමේ වියදම් ද ඇතුළත් විය යුතුය."

07-185

1A - G 14695 — 350 (2011/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.